මාධ්‍ය නිවේදනය

2017 නොවැම්බර් 23 කොළඹදී...

Nestlé
Good Food, Good Life

# නෙස්ලේ වෙළෙඳ නාම මැගී හා නෙස්ටමෝල්ට් Kantar ලෝක කම්ටුව විසින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම FMCG සන්නාමයන් 10න් එකක් ලෙස නම්කරයි

පර්යේෂණ සමාගමක් වන Kantar ලෝක කම්ටුව විසින් සිය නවතම සන්නාම ශ්‍රේණිගත කිරීම හරහා නෙස්ලේ සමාගමේ කීර්තිමත් සන්නාම දෙකක් වන මැගී සහ නෙස්ටමෝල්ට්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම FMCG සන්නාමයන් 10න් එකක් ලෙස නම්කරන ලදී. ප්‍රමුඛතම සන්නාම 10 අතරට එක්වුණු එකම නූඩ්ල්ස් හා මෝල්ට් පාන සන්නාමයන් එය වීම විශේෂත්වයකි. පාරිභෝගික නිවාස ඒකක මිලියන 05කට, සන්නාම 400කට හා පාරිභෝගික තේරීම් බිලියන 1.4කට වඩා සංඛ්‍යාවක් ආවරණය කරමින් පැවැත්වුණු මෙම සමීක්ෂණයේදී ඒ ඒ සන්නාම කොපමණ පාරිභෝගික නිවාස සංඛ්‍යාවක්, කොපමණ වාරයක් මිලදී ගනු ලබන්නේද යන්න පදනම් කරගැනිණ.

මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේහි කළමනාකාර අධ්‍යක්ෂිකා, ශිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ පැවසුවාය. අපේ සියලු සන්නාමයන්, ජීවිතයේ ගුණාත්මක බව ඉහළ නැංවීම හා සෞඛ්‍යමත් අනාගතයකට දායකවීම යන අප සමාගමටම පොදු වූ අරමුණ වටා කේන්ද්‍රගත වී පවතිනවා. අපේ නිෂ්පාදන මිලදී ගනු ලබන්නේ අපගේ සන්නාම පිළිබිඹු කරන්නාවූ සැබෑ වටිනාකම අගය කරන පාරිභෝගිකයිනුයි. වඩාත් රසවත්, සෞඛ්‍යමත් හා උසස් ප්‍රමිතියෙන් යුත් අපේ නිෂ්පාදන නිපදවීමේදී අප දක්වන කැපවීමට මෙන්ම තිරසාර නිෂ්පාදනයට හා ආචාර ධර්මානුකූල ව්‍යාපාර මෙහෙයුම් සම්බන්ධයෙන් අපගේ කැපවීමට ඔවුන්ගේ ගෞරවය අපට නිරන්තරව ලැබෙනවා. අපගේ සන්නාම දෙකක් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම FMCG සන්නාමයන් 10 අතරට තේරීම අපට ගෞරවයක්. ඉන් පිළිබිඹු වෙන්නේ, පාරිභෝගිකයන්ගේ ජීවිතවලට අපගේ නිෂ්පාදන හරහා ලැබෙන අර්ථවත් දායකත්වය හා එහිදී අප දිනා තිබෙන විශ්වාසයයි".

මැගී තම කුකුළු මස් රසැති නූඩ්ල්ස්වල රසය තවත් වැඩි කිරීමට, කුළුබඩු වර්ග අටක් සහිතව නව නිෂ්පාදනයක් ලෙස මෑතකදී නව මුහුණුවරකින් වෙළෙඳපොළට නිකුත් කර ඇත. ව්‍යංජන හා අනෙකුත් දේශීය ආහාර සඳහා ස්වභාවික රසගන්වන වශයෙන් කුළුබඩු බහුලව භාවිතා කෙරෙන අප රටේ, මෙම නූඩ්ල්ස් නව හඳුන්වාදීම සඳහා මැගී ද ඒ හා සමාන පියවරක් අනුගමනය කර ඇත. ඒ අනුව එවැනි රසයක් එකතු කිරීමට ශ්‍රී ලංකාවේ මුළුතැන්ගෙවල්වල සාම්ප්‍රදායිකව භාවිතා කරන එළවළු, ඖෂධීය ශාක, ජනප්‍රිය කුළුබඩු එනම්, කොත්තමල්ලි, ගම්මිරිස්, කහ, එනසාල්, සුදුරු, සාදික්කා, උළුහාල් හා ඇනිසි ආදිය යොදා ගැනේ. දිනපතා ආහාර පිසීම පහසු කරවන 'මැගී රසමුසු'වල සුදුළූණු, මිරිස්, කහ, සුදුරු, සාදික්කා සහ උළුහාල් යනාදිය අඩංගු විශේෂ කුළුබඩු මිශ්‍රණයක් අන්තර්ගත වේ. මැගී පිටිකළ පොල්කිරි පරම්පරා ගණනාවක් පුරා ශ්‍රී ලාංකේය නිවාසවල ප්‍රියතම නිෂ්පාදනයක් වී ඇත. සියයට සියයක්ම ශ්‍රී ලාංකේය පොල් යොදාගෙන නිෂ්පාදනය කෙරෙන, තවද නැවුම්

හා ප්‍රනීත රසයක් ආහාරයට එක්කරන මැගී පිටිකළ පොල්කිරි තුළින් උසස් තත්ත්වයේ පොල් කිරි යොදාගනිමින් යහගුණයෙන් යුතු ආහාර නිවසේදීම පිළියෙල කරගැනීමට දිරි දී තිබේ.

නවතම නෙස්ටමෝල්ට් ප්ලස් හඳුන්වාදීමත් සමග නෙස්ටමෝල්ට් ද සිය පෝෂණීය ගුණය තවදුරටත් වැඩිදියුණු කළේය. ඕට්ස් යහගුණයෙන් පරිපූර්ණ නව නෙස්ටමෝල්ට් ප්ලස් තුළින් කාර්යබහුල ජීවන රටාවක් ගෙවන නූතන යුගයේ පාරිභෝගිකයන්ට ක්‍රියාශීලී දිවියක් පවත්වාගැනීමට සහාය සපයයි. ඊට විටමින් හා ඛනිජ ලවණ ද අන්තර්ගත වන අතර ජලය පමණක් බාහිරව එක් කිරීමෙන් එහි අඩංගු මෝල්ට් සාරයට, ඕට්ස් හා කිරිවලට මනා සංයෝගයක් ලබාදෙයි.

සෞඛ්‍යමත් අනාගතයක් වෙනුවෙන් නෙස්ලේ සමාගමේ කැපවීම එහි සන්නාම ක්‍රියාකාරකම් හරහා ද දැකිය හැක. මැගී සන්නාමය, තම නිෂ්පාදන ඇසුරුම්වල හා අන්තර්ජාලයේ උපදෙස් හා ආහාර වට්ටෝරු මගින් මෙන්ම මැගී රස චාරිකා ඉවුම්පිහුම් වැඩසටහන් හරහා ද ජනතාවට සමබල ආහාරවේලක් ලෙස රසවත් ආහාර පිළියෙල කරගැනීමට සහාය වේ. නෙස්ටමෝල්ට් සන්නාමය ද දැවැන්ත පරිමාණයේ පවුල් වැඩසටහන් පැවැත්වීම තුළින් ද වාර්ෂිකව සාම්ප්‍රදායික උත්සව තරගාදියටත් පවර් මැරතන් සඳහාත් අනුග්‍රාහකත්වය දැක්වීම ආදිය තුළින් දේශීය ප්‍රජාවට සෞඛ්‍යමත් හා ක්‍රියාශීලි ජීවන රටාවක් පවත්වාගැනීමට දායක වී ඇත.

විස්තීර්ණ හා සියුම් දෘෂ්ටියක් සහිත Kantar සන්නාම ශ්‍රේණිගත කිරීම් අධ්‍යයනය ඔස්සේ පෙනී ගොස් ඇත්තේ, අවිනිශ්චිත හා අභියෝගාත්මක කාලපරිච්ඡේදවලදී පවා ඉහළ පාරිභෝගික ප්‍රතිචාර හා මිලදීගැනීම් ප්‍රකට කරමින් ශක්තිමත් සන්නාමයන්හි වර්ධනය දිගින් දිගටම සිදුවන බව ය.